(7)

# අභ්‍යන්තර සටහන

## පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2022-08- 30 |
| වෙත | සියළුම කාර්ය මණ්ඩලය වෙත |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | කාර්ය මණ්ඩල අංශ ප්‍රධානීන් |
| විෂයය | අනවසරයෙන් කාර්ය ස්ථානයෙන් බැහැරව යාම |
| ගොනු අංකය | BD/PGH/CPMA/1/2013 |

මෙම රෝහලේ ඇතැම් කාර්ය මණ්ඩලයේ නිලධාරින්/සේවකයින් රෝහල් පරිශ්‍රයන්ගෙන් පිටතට අවසරයකින් තොරව ගමන් කරන අවස්ථා ඇති බවත්, ඇතැම් නිලධාරින්/සේවකයින් ස්වකීය තනතුරට අදාළ නිලඇඳුම සහිතව කාර්ය ස්ථානයෙන් පිටතට යන බවද මා වෙත නිරික්ෂණය වේ. ආයතන සංග්‍රහයේ Xii වන පරිච්ඡේදයේ 3 වන වගන්තිය මඟින් අවසර නොලබා ස්වකීය කාර්ය ස්ථානයෙන් පිටයාමට නිලධරයෙකුට නුපුළුවන බව දක්වා තිබෙන බැවින්, එය විනයානුකූලව ක්‍රියාමාර්ග ගත හැකි විෂමාචාරයක් බව පෙන්වා දෙමි.

ඒ අනුව, මින් ඉදිරියට පූර්ව අවසරයකින් තොරව ස්වකීය කාර්ය ස්ථානයවන රෝහල් පරිශ්‍රයෙන් පිටතට නොයන ලෙස මෙයින් දැනුම් දෙමි. යම් හෙයකින් එළෙස අවසරයකින් තොරව ගිය බව අනාවරණය වුවහොත් විනයානුකූලව කටයුතු කරන බවත්, අවසරයකින් තොරව ගොස් යම් අනතුරක් හෝ යම් සිදුවීමකට සම්බන්ධවී නීතිමය කාර්යයන් සිදු වුවහොත් එහි වගකීම අවසරයකින් තොරව ගිය නිලධාරියා/සේවකයා විසින්ම දැරිය යුතු බවත් මෙයින් වැඩිදුරටත් දැනුම් දෙමි.

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.
30/8/22